# ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය
# இலங்கை சாரணர் சங்கம்
# Sri Lanka Scout Association

Incorporated by Parliamentary Act No. 13 of 1957
Member of the World Organization of Scout Movement


2026.09.08 චක්‍රලේඛ අංක 70/2026

සියළුම දිසා කොමසාරිස්වරුන් වෙත,

<u>බාලදක්ෂ දිසාවක සිටිය යුතු සහය දිසා කොමසාරිස්වරුන් හා විෂය ක්ෂේත්‍ර</u>

## 1. *බාලදක්ෂ දිසාවක සිටිය යුතු සහය දිසා කොමසාරිස්වරු සංඛ්‍යාව*

1.1 2021/04/01 දිනැති අංක 29/2021 දරන චක්‍රලේඛය මෙතැන් සිට අවලංගු වේ.

1.2 බාලදක්ෂ දිසාවක සිටිය හැකි උපරිම සහය දිසා කොමසාරිස්වරු සංඛ්‍යාව 15 දක්වා වැඩි කරන අතර, විශේෂ අවශ්‍යතාවය මත හා සංගණන දත්ත උපයෝගී කර ගනිමින් දිසා කොමසාරිස්වරයා විසින් සාධාරණ හේතු සහිතව ප්‍රධාන කොමසාරිස්තුමා වෙත කරනු ලබන ඉල්ලීමකට අනුව උපරිම සංඛ්‍යාව 20 ක් දක්වා වැඩි කිරීමට ප්‍රධාන කොමසාරිස්වරයා විසින් සලකා බලනු ලැබේ.

1.3 එසේ ම සහය දිසා කොමසාරිස්වරයෙකුට එක් විෂය ක්ෂේත්‍රයක සිටිය හැකි උපරිම කාලසීමාව වසර 05 කි. එවැනි වාර දෙකක උපරිම සේවා කාලයකට යටත් වේ. එසේ වුව ද විශේෂ අවස්ථාවක තවත් පස් අවුරුදු කාලසීමාවක් සඳහා සහය දිසා කොමසාරිස්වරයෙකු ලෙස කටයුතු කිරීමට ප්‍රධාන කොමසාරිස්වරයා වෙත කරනු ලබන විශේෂ ඉල්ලීමක් සේ සලකා බලනු ලැබේ.

1.4 සහය දිසා කොමසාරිස්වරයෙකුගේ බලපත්‍රය වාර්ෂිකව නවීකරණය කළ යුතු ය. දිසා කොමසාරිස්වරයා විසින් වාර්ෂිකව සහය දිසා කොමසාරිස්වරුන්ගේ බලපත්‍ර නවීකරණය කිරීම සඳහා ජාතික බාලදක්ෂ මූලස්ථානයට එවිය යුතු අතර, දිසාවේ සිටිය යුතු සහය දිසා කොමසාරිස්වරුන්ගේ උපරිම සීමාවට යටත්ව නව සහය දිසා කොමසාරිස්වරුන් පත් කිරීමට ද හැකිය. (ඉහත කුමක් සඳහන් වුවද, සහය දිසා කොමසාරිස්වරයෙකුගේ පත්කිරීම වසර පහක් සඳහා පත් කරනු ලබන්නක් බව නොසැලකිය යුතු අතර, එය එම ධූරයේ රැඳී සිටීම සඳහා වන උපරිම කාලසීමාව වේ. පත් කිරීම බලපැවැත්වෙන්නේ වසරක් සඳහා වන අතර, ඒ සඳහා ද අධිකාරී පත්‍රය නවීකරණය වී තිබීම අනිවාර්ය වේ.)

## 2. *බාලදක්ෂ දිසාවේ සහය දිසා කොමසාරිස්වරුන් ගේ විෂය ක්ෂේත්‍ර*

බාලදක්ෂ දිසාවක පහත සඳහන් අයුරින් විෂය ක්ෂේත්‍ර සඳහා සහය දිසා කොමසාරිස්වරුන් අනිවාර්යෙන් ම පත් කළ යුතු අතර, මානව සම්පත් හි හිඟකම හේතුවෙන් සුදුසු පරිදි හෝ හැකියාව මත විෂය ක්ෂේත්‍ර දෙකක් හෝ කීපයක් සඳහා එක් සහය දිසා කොමසාරිස්වරයකු පත් කළ හැකි ය.

උදා- 1. සහය දිසා කොමසාරිස් (සංවර්ධන හා සුභ සාධක)
2. සහය දිසා කොමසාරිස් - (සුපිපි බාලදක්ෂ හා සිඟිති බාලදක්ෂ)


65/9 ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02. ශ්‍රී ලංකා
சேர் சிற்றம்பலம் ஏ காடினர் மாவத்தை, கொழும்பு 02.
Sir Chittampalam A Gardiner Mawatha, Colombo 02, Sri Lanka.

Tel : +94 112 433131 / +94 112 433512
Fax : +94 112 433131
E-mail : slsaheadq@gmail.com
Web : www.scout.lk

**පහත සඳහන් විෂය ක්ෂේත්‍ර සඳහා සහය දිසා කොමසාරිස්වරුන් අනිවාර්යයෙන් පත් කර ගත යුතුය.**

1. සහය දිසා කොමසාරිස් (පරිපාලන)
2. සහය දිසා කොමසාරිස් (පුහුණු)
3. සහය දිසා කොමසාරිස් (වැඩසටහන්)
4. සහය දිසා කොමසාරිස් (සුපිපි බාලදක්ෂ)
5. සහය දිසා කොමසාරිස් (සිඟිති බාලදක්ෂ)
6. සහය දිසා කොමසාරිස් (පෝතක බාලදක්ෂ)
7. සහය දිසා කොමසාරිස් (බාලදක්ෂ)
8. සහය දිසා කොමසාරිස් (මානවක බාලදක්ෂ)
9. සහය දිසා කොමසාරිස් (බාලදක්ෂ බාලිකා)
10. සහය දිසා කොමසාරිස් (මූල්‍ය)
11. සහය දිසා කොමසාරිස් (සංවර්ධන)
12. සහය දිසා කොමසාරිස් (මාධ්‍ය, මහජන සම්බන්ධතා සහ සංස්කෘතික)
13. සහය දිසා කොමසාරිස් (සුභ සාධන)
14. සහය දිසා කොමසාරිස් (ජාත්‍යන්තර කටයුතු)
15. සහය දිසා කොමසාරිස් (දිසා මූලස්ථාන කළමණාකරණ)
16. සහය දිසා කොමසාරිස් (තොරතුරු තාක්ෂණ)

දිසා කොමසාරිස්වරයාට දිසාවේ පවතින අවශ්‍යතාවය මත ඉහත විෂය ක්ෂේත්‍ර වලට අමතරව සහය දිසා කොමසාරිස්වරුන් සඳහා අමතර විෂය ක්ෂේත්‍ර නිර්මාණය කළ හැකි අතර, ඒ පිළිබඳව ප්‍රධාන කොමසාරිස්තුමාගේ අනුමැතිය ලබා ගත යුතු වේ. එසේ වුවද ඒ කිසිදු අවස්ථාවක නියම කර ඇති සහය දිසා කොමසාරිස් සංඛ්‍යාව නොඉක්මවිය යුතු ය.

උදා - 1. සහය දිසා කොමසාරිස් (විශේෂ ව්‍යාපෘති)
2. සහය දිසා කොමසාරිස් (ප්‍රාදේශීය සම්බන්ධීකරණ)
3. සහය දිසා කොමසාරිස් (මුහුදු බාලදක්ෂ/ගුවන් බාලදක්ෂ/පොලිස් බාලදක්ෂ)

## 3. *සහය දිසා කොමසාරිස්වරුන්/ දිසා බාලදක්ෂ නායකයන් සක්‍රියව බාලදක්ෂ කණ්ඩායමක නායකයකු වශයෙන් වගකීම දැරීම.*

3.1 සහය දිසා කොමසාරිස්වරුන් හෝ දිසා බාලදක්ෂ නායකයින් බාලදක්ෂ කණ්ඩායම් මෙහෙයවීමට සක්‍රියව දායක වෙමින් කටයුතු කිරීමට අවසර ලබා දීම දිසා කොමසාරිස්තුමා වෙත බලය පැවරේ. මෙහි දී දිසා නායකයින්ට හා සහය දිසා කොමසාරිස්වරුන්ට බාලදක්ෂ කණ්ඩායම් පවත්වාගෙන යාමට දිරි ගැන්වීමක් ලැබෙන ලෙස කටයුතු කළ යුතු ය.

3.2 දිසා බාලදක්ෂ නායකයකුට හෝ සහය දිසා කොමසාරිස්වරයකුට තම දිසාව තුල බාලදක්ෂ කණ්ඩායමක බාලදක්ෂ නායකයකු ලෙස සක්‍රීයව කටයුතු කිරීමට අවශ්‍ය වන්නේ නම් එම විදුහලේ විදුහල්පතිතුමා/තුමිය ගේ හෝ ආයතන ප්‍රධානියා ගේ ලිඛිත අවසරයක් ලබා ගත යුතු අතර, ඒ සඳහා දිසා කොමසාරිස්වරයාට වසරක කාලයකට යටත්ව ලිපියක් නිකුත් කළ හැකි ය. ඒ සඳහා වෙනම අධිකාරී පත්‍රයක් නිකුත් නොකරන අතර, තමා දරන දිසා නායක හෝ සහය දිසා කොමසාරිස් අධිකාරී පත්‍රය

යටතේ දිසා කොමසාරිස්තුමා නිකුත් කළ බලය පැවරෙන ලිපියේ කාලසීමාව දක්වා කටයුතු කළ හැකි ය. මෙම වලංගු ලිපිය දිසා නායකයින් හා සහය දිසා කොමසාරිස්වරුන් වාර්ෂිකව ඉහත ක්‍රමවේදය යටතේ නවීකරණය කර ගත යුතු ය. මෙවැනි බලය පැවරෙන ලිපියක් නිකුත් කල හැක්කේ සහකාර දිසා කොමසාරිස්වරයකු හෝ දිසා බාලදක්ෂ නායකයකු ලෙස අධිකාරී පත්‍රය හිමි අයකුට පමණි.

4. ***මානවක බාලදක්ෂ නායක /බාලදක්ෂ නායක /පෝතක බාලදක්ෂ නායක /සිඟිති බාලදක්ෂ නායක හා සහය මානවක බාලදක්ෂ නායක /සහය බාලදක්ෂ නායක /සහය පෝතක බාලදක්ෂ නායක /සහය සිඟිති බාලදක්ෂ නායක අධිකාරී පත්‍රය යටතේ කටයුතු කිරීම.***

ඉහත තනතුරු යටතේ අධිකාරී පත්‍රයක් හිමි සියළු ම නායක නායිකාවන්ට අධිකාරී පත්‍රය හිමි බාලදක්ෂ කණ්ඩායම/මානවක සමාජය/පෝතක රැල හෝ සිඟිති ගොමුවේ පමණක් බාලදක්ෂ කටයුතු කිරීමට නීත්‍යානුකූලව බලය පැවරේ. ඒකකයට අදාල අධිකාරී පත්‍රයක් නොමැතිව වෙනත් බාලදක්ෂ ඒකකයක කටයුතු කිරීමට නොහැකි ය. (පාසලක සුපිපි, සිඟිති, පෝතක, බාලදක්ෂ හා මානවක අධිකාරී පත්‍රයක් හිමි නායක/නායිකාවක **<u>කිසිදු මූල්‍ය ප්‍රතිලාභයක් අපේක්ෂාවෙන්</u>** වෙනත් සුපිපි, සිඟිති, පෝතක, බාලදක්ෂ හා මානවක කණ්ඩායමක කටයුතු නොකළ යුතු ය.)

5. ***වාර්ෂිකව අධිකාරී පත්‍රය නවීකරණය කිරීම.***

ඕනෑම අධිකාරී පත්‍රයක වලංගු කාලය එක් වර්ෂයක් වන අතර, ඉදිරි වර්ෂය සඳහා අධිකාරී පත්‍රය නවීකරණය කරවීම පරිපාලන සහය දිසා කොමසරිස්වරයාගේ ප්‍රමුඛ වගකීමක් වනු ඇත. සියළුම අධිකාරී පත්‍ර ඉදිරි වර්ෂය සඳහා නවීකරණය කරවා ගැනීම සඳහා අදාල වර්ෂයේ ඔක්තෝම්බර් මාසයේ 30 වන දිනට පෙර ජාතික බාලදක්ෂ මූලස්ථානයට එවිය යුතු ය. ඒ සම්බන්ධව වාර්ෂිකව ජාතික මූලස්ථානය මගින් චක්‍රලේඛයක් නිකුත් කරනු ලැබේ.

ස්තූතියි,

මෙයට,
බාලදක්ෂ සේවයේ නියුතු,

***සම්පත් කාරියවසම්***
සහය ප්‍රධාන කොමසාරිස් (කළමණාකරණ හා මූල්‍ය)

Sampath Kariyawasam
Assistant Chief Commissioner
(Management & Finance)
Sri Lanka Scout Association
65/9, Sir Chittampalam A Gardiner Mw,

***නිශ්ශංක මනෝජ් නානායක්කාර***
ප්‍රධාන බාලදක්ෂ කොමසාරිස්

Manoj Nanayakkara
(Attorney-at-Law)
Chief Commissioner
Sri Lanka Scout Association
65/9, Sir Chittampalam A Gardiner Mw,
Colombo 02, Sri Lanka

පිටපත් -

1. ජාතික මූලස්ථානයේ සියළුම කොමසාරිස්වරුන් - කා.දැ.පි.
2. ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ සභාපති, විධායක කමිටු සභාපති, ගරු ලේකම් හා ගරු භාණ්ඩාගාරික - කා.දැ.පි.
3. කාර්යාල ලිපිගොනුවට